# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි දෙවන පරීක්ෂණය (බාහිර) - 2019

2023 අගෝස්තු / සැප්තැම්බර්

මානවශාස්ත්‍ර පීඨය

**බෞද්ධ සංස්කෘතිය** (නව/පැරණි නිර්දේශය)

**බෞද්ධ කලා, පුරාවස්තු හා භික්ෂු භික්ෂුණී සංස්ථා BUCU – E 2015**

කොටස් දෙකෙන්ම ඇතුළත් වන පරිදි ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න.

ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි. කාලය : පැය 03 යි.

---

### පළමු කොටස

01. බෞද්ධ සංඝාරාමයේ ප්‍රභවය දක්වා භාරතීය බෞද්ධ ලෙන් විහාරයන් හි නිර්මාණාත්මක හා වාස්තුවිද්‍යාත්මක ලක්ෂණ මූලාශ්‍රයානුසාරයෙන් පෙන්වා දෙන්න.

02. බුදුසිරිතේ සුවිශේෂ අවස්ථා නිරූපණය කිරීමෙහි ලා බුද්ධ ප්‍රතිමා ශිල්පියාට අභිමත වූ මුද්‍රා කවරේදැයි ලාංකේය බුද්ධ ප්‍රතිමා ඇසුරෙන් ගෙනහැර දක්වන්න.

03. 'භාරතීය බුද්ධ ප්‍රතිමාවේ පරිසමාප්තිය ගුප්ත යුගයේ ප්‍රතිමා නිර්මාණ මගින් ප්‍රකට වේ.' මෙය බුද්ධ ප්‍රතිමාවේ විකාසය ඇසුරෙන් සනාථ කරන්න.

04. බෞද්ධ සංස්කෘතික සංකල්ප සමාජගත කිරීමෙහි ලා මහනුවර යුගයේ චිත්‍ර සම්ප්‍රදායට අනන්‍යව පැවති ශිල්පීය උපක්‍රම කවරේදැයි සනිදර්ශනව පහදන්න.

05. සඳකඩපහනේ විකාසය පැහැදිලි කරමින් එහි සංකේතවාද පිළිබඳ ප්‍රමාණවත් විස්තරයක් සපයන්න.

### දෙවන කොටස

06. බෞද්ධ පැවිදි සංස්ථාවේ සංවර්ධනය පිණිස ඉවහල් වූ සමාජ සාධක කවරේදැයි මූලාශ්‍රයානුසාරයෙන් පෙන්වා දෙන්න.

07. උපසම්පදාව අර්ථකථනය කරමින් එහි විනයානුකූල පදනම පෙන්වා දෙන්න.

08. ස්ත්‍රීත්වය පිළිබඳ සාම්ප්‍රදායික භාරතීය සමාජයේ පැවති අදහස් කාන්තා පැවිද්ද අනුමත කිරීමෙහි ලා ඉවහල් වූ අයුරු භික්ෂුණී සමාජයේ ප්‍රභවය ඇසුරෙන් පරීක්ෂා කරන්න.

09. දේපල පරිහරණය පිළිබඳ සාසනික පදනම මගින් භාවිතයට ගෙන ඇති කළමනාකරණ මූලධර්ම කවරේදැයි පෙන්වා දෙන්න.

10. සංඝකර්ම හඳුන්වා දෙමින් එහි විනයානුකූල ස්වභාවය විස්තර කරන්න.

**********************************